මම හවුල්භාවයෙන්, හවුල්කරුවන්ගේ අවශ්යතාවයෙන් ස්වයංපෝෂිත වෙමි. කවරෙකු මා සමග, මා හැර වෙනත් අයකු හවුල් කරමින් යම් ක්රියාවක් කළේ ද මම ඔහු හා ඔහුගේ හවුල්භාවය අත්හැර දමමි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. උත්තරීතර අල්ලාහ්
මෙසේ පවසයි: "මම හවුල්භාවයෙන්, හවුල්කරුවන්ගේ අවශ්යතාවයෙන් ස්වයංපෝෂිත වෙමි. කවරෙකු මා සමග, මා හැර වෙනත් අයකු හවුල් කරමින් යම් ක්රියාවක් කළේ ද මම ඔහු හා
ඔහුගේ හවුල්භාවය අත්හැර දමමි." [صحيح] [رواه مسلم]

සෑබවින්ම උත්තරීතර අල්ලාහ් තමන් හවුල් භාවයෙන්, හවුල්කරුවන්ගේ අවශ්යතාවයෙන් තොර බව පවසා සිටින්නේ යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියි. ඔහු සියලු දෑහි අවශ්යතාවන්ගෙන් තොරය. සැබැවින්ම මිනිසා යම් නැමදුම් කටයුත්තක් සිදු කළ විට, එය අල්ලාහ්ටත් ඔහු හැර වෙනත් අයටත් පත් කර ගන්නේ නම් අල්ලාහ් ඔහුව අත්හැර දමන අතර ඔහුගෙන් එය පිළිගන්නේ ද නැත. එය අදාළ තැනැත්තාටම යොමු කරයි. උත්තරීතර අල්ලාහ්ට පමණක් ක්රියාව අවංකව ඉටු කිරීම අනිවාර්යය වේ. හේතුව ගෞරවණීය ඔහුගේ තෘප්තිය වෙනුවෙන් අවංකව සිදු කරන දෑ හැර වෙනත් කිසිවක් සුවිශුද්ධයාණන් පිළිගන්නේ නැති බැවිනි.

https://sunnah.global/hadeeth/si/show/3342